# ශ්‍රී ලංකාවේ පුරාණ ඉඩම් භුක්තිය සහ සිංහල ගැමි අර්ථක්‍රමය (1948 නිදහස ලැබීමට පෙර)

ඩී. එස්. ඩබ්. ගුණවර්ධන

## Abstract

*A critical examination of the Sri Lankan rural social structure and the organization was revealed that a land tenure has been playing a very significant role in the traditional society in the past as well as modern society. Specially, when considering the rural economy of Sri Lankan society land can be identified as major factor. Many scholaİ have ventured to study the manner in which the land tenure had influenced the rural economy (Peris: 1953, Ryan: 1953, Leach: 1961, Yalman: 1967, Obeyesekere: 1967). However, it is clearly evident that the traditional Sinhala village has undergone critical changes during recent times. In this background, the study attempted to ascertain two major aspects of the land tenure. Fiİt, to identify the how organize that existed land tenure in the past specially, before the independence of Sri Lanka. Secondly, to identify, relationship that existed between land tenure and rural economy of Sinhalese society.*

*Methodology applied in the present study is literature survey. It was completely based on secondary data. Secondary level data were collected from the recent studies relating to the land tenure in traditional Sinhalese society. These are the two basic methods adopted to conduct this study. Fiİt, a historical method is used to ascertain the historical background of the land tenure. Second, a comparative method was adopted to compare the past and the present conventions, traditions and practices pertaining to land tenure.*

*In conclusion, study revealed that the land was m§t valuable factor for upward social mobility of the people in Sri Lanka. Before the western colonialism land has been playing vital role in organizing the Sri Lankan society. However, as a result of western colonialism, land tenure has undergone major changes and caused to be various social problems in the Sri Lankan society.*

**Key words:** Land tenure, Modernization, Social change, Social mobility, Western colonialism

**Author Details:** ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජීය විද්‍යා අංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

**Citation:** ගුණවර්ධන, ඩී. එස්. ඩබ්., (2013), ශ්‍රී ලංකාවේ පුරාණ ඉඩම් භුක්තිය සහ සිංහල ගැමි අර්ථක්‍රමය (1948 නිදහස ලැබීමට පෙර) කැණිමඩල, 1(1)

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික අර්ථක්‍රමය කෘෂිකර්මාන්තය පදනම් කරගත් වී ගොවිතැනට මුල් තැනක් දී ගොඩනැගුණක් බැවින් ප්‍රධාන ධනෝපායන මාර්ගය වූයේ මහපොළවයි. ජනගහනයෙන් වැඩි කොටසකගේ ජීවනෝපාය කෘෂි කර්මාන්තය වූ බැවින් රජයට වැඩි ආදායමක් ලැබුණේ ද මේ මගිනි. වැසියන් ගේ ජීවිතය සම්පූර්ණයෙන් ම රඳා පැවතියේ සාර්ථක ලෙස වී ගොවිතැන් කිරීම මත ය. ඔවුන්ගේ ජීවන ආධාරකය වූයේ එයයි (පීරිස්, 1956:40). මේ අනුව සාම්ප්‍රදායික ගැමි අර්ථක්‍රමය කෘෂිකර්මාන්තය මත රඳා පැවති හෙයින් ඉඩම් වලට විශේෂ වැදගත්කමක් හිමි විය.

මේ පිළිබඳ අදහස් ඉදිරිපත් කරන බොහෝ දෙනා ගේ (Obeyesekere 1967, Leach 1961, Yalman 1967, Perera 1985, Abeysinghe 1978, කොඩ්රිංටන් 1980) විග්‍රහයන් තුළින් මෙය තවදුරටත් තහවුරු වේ. ඉඩම් සම්බන්ධයෙන් පැවති වටිනාකම තවදුරටත් පැහැදිලි කිරීමේ දී ඇම්. බී. ආරියපාල පවසන්නේ,

විශාල කර්මාන්ත සම්බන්ධව දැනුමක් නොතිබූ මෙම කාලවල දී ප්‍රධාන රක්ෂා මාර්ගය වූයේ ගොවිකමත් එහෙයින් ඉඩම්වලින් ඉපැයුණු ආදායම රජයේ ප්‍රධාන ආදායම් මූලය වූ බවත්ය (ආරියපාල 1962:320).

විශේෂයෙන් ගැමි ජීවිකාව ගොවිතැන මත ගොඩනැගුණු බැවින් ගැමියන් ඉඩම් පිළිබඳ ව දැඩි ඇල්මකින් හා බැඳීමකින් ජීවත් වූ පිරිසක් වි ය. ගමේ සිට සැතපුමක් හෝ දෙකක් ඈතින් පදිංචි වූ අමුත්තකු වුව ද තමාගේ ගමෙහි ඉඩම් අත්පත් කර ගැනීමට ගමේ එකා දක්වන විරෝධය ලංකාවේ ඇතැම් පෙදෙස්වල තවමත් බලවත් ය (කොඩ්රිංටන් 1980:01) යන ප්‍රකාශයෙන් ගැමියන් සහ ඉඩම් අතර ඇති බැඳීම කෙබඳු දැයි තහවුරු වේ.

මේ ආකාරයට ගැමි අර්ථ ක්‍රමය තුළ වැඩි වටිනාකමක් ඇති නිෂ්පාදන සාධකයක් වශයෙන් ඉඩම් පිළිබඳ ව විග්‍රහ කිරීමේ දී පුරාණ ලාංකේය සමාජයේ, විශේෂයෙන් සාම්ප්‍රදායික සමාජ අවධියේ සහ අධිරාජ්‍යවාදී පාලන සමාජ අවධියේ අවසාන කාලය තෙක් ඉඩම් භුක්තිය කෙසේ සංවිධානය වී තිබුණ ද යන්න සහ එය ගැමි අර්ථ ක්‍රමයට කරන ලද බලපෑම කෙබඳු ද යන්න විග්‍රහ කිරීම මෙහි දී මූලික වශයෙන් බලාපොරොත්තු වේ.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දී ඓතිහාසික ක්‍රමය සහ තුලනාත්මක ක්‍රමය (Historical and Comparative Method) යොදා ගනු ලැබූ අතර දත්ත රැස්කිරීමේ දී ද්විතියික දත්ත (Secondary Data) සඳහා මූලිකත්වය ලබා දෙන ලදී. ඒ අනුව ඉඩම් භුක්තිය සම්බන්ධයෙන් මෙ තෙක් රචනා වී ඇති විවිධ මූලාශ්‍ර පරිශීලනය කොට ඒවා විශ්ලේෂණය කිරීමෙන් නිගමනවලට එළැඹුණි.

## විවරණය

ගැමි අර්ථක්‍රමය තුළ ඉඩම් භුක්තියේ ස්වරූපය හඳුනා ගැනීමේ දී -ගම" යන ඒකකයෙහි තුළ ඉඩම් පංගු රාශියක් හඳුනාගත හැකි වේ. රැල්ප් පීරිස් ගේ අදහසට අනුව,

*සමහර අවස්ථාවල දී ඉඩකඩම් හෝ වතුපිටි හැඳින්වීමට භාවිතා කරන ලද -ගම" යන සිංහල වචනය (පාලි:ගාම, සංස්කෘත: ග්‍රාම) ඉඩම් පංගු රාශියක් නිරූපණය කිරීමට ද යෙදිණි. ගමේ කොටසක් වූ එක් ඉඩමක් පංගුව හෙවත් වසම යන පදයෙන් හඳුන්වා දෙන ලද හෙයින් ගම යන පදය එක් ස්ථානයක පිහිටි ඉඩම් පංගු රාශියක සංහතාවකි* (පීරිස්, 1964:39).

මේ අනුව ගම ඉඩම් පංගු රාශියක එකතුවක් වන අතර එම ඉඩම් පංගු ගැමියන් විසින් විවිධාකාරයෙන් යොදා ගනු ලැබේ. ගැමි අර්ථ ක්‍රමය සකස් වීමේ දී මෙම ඉඩම් ප්‍රධාන වශයෙන් කුඹුරු ඉඩම් (Paddy Lands) වශයෙන් ද විවිධ පළතුරු සහ ගස්වලින් සැදුණු ගොඩ ඉඩම් නැතහොත් වතු (High Lands) වශයෙන් ද, කැලෑ එළිකොට පුළුස්සා වාරයෙන් වාරයට වගා කරන ලද කැලෑබිම් වූ හේන් (Chenas) වශයෙන් ද භුක්ති විඳිණු ලැබිණ.
ගැමි ආර්ථිකයෙහි කුඹුරු ඉඩම්වලට හිමි වූයේ විශේෂ වටිනාකමකි. සෑම ගමක ම කේන්ද්‍රස්ථානය වූයේ ගොවිතැන් කරනු ලබන කුඹුර ය. ගැමියන් ගේ ආර්ථික සහජීවනය මුළුමනින් ම රඳා පැවතියේ සාර්ථකව කරනු ලබන වී ගොවිතැන මත ය. බොහෝ විට කෙනෙකු තමන් ගේ ගම්වැසිකම පිළිබඳ ප්‍රධාන සාධකය වශයෙන් දක්වූයේ ද ගමේ කුඹුරුවලට ඇති අයිතියයි. සෑම ගමක ම වාගේ ගම් වැසියන්ට පමණක් සීමා වූ කුඹුරක් වි ය. බොහෝ විට මේ කුඹුර හඳුන්වනු ලැබුයේ මහයා ය. නැත්නම් මහ කුඹුර යනුවෙනි. ගමේ මුල් පදිංචිකාරයින් ගෙන් පැවත එන සියලු දෙනාට ම ඒ මහ කුඹුරේ පංගු අයිති වි ය (අමුණුගම 1999:52). මේ පිළිබඳව තවදුරටත් පැහැදිලි කරන අමුණුගම,

*සිංහල ගැමි ජීවිතයේ ප්‍රධාන ස්ථානයක් ගත්තේ ගොවිතැනයි. ගමේ අන් සියලුම සංස්ථා සහ සාමාජික සබඳතා*

> *ගොවිතැන මුල් කරගෙන ඇති වූ බව කීම යුක්ති සහගතය. මුදල් හදල් හුවමාරුව බහුලව නොපැවති අවධියක එක් එක් තැනැත්තා තම තමන්ගේ ජීවිකාව රැක ගත්තේ ගොවිතැන් කිරීමෙන් හා තම අතිරික්තය අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් සඳහා හුවමාරු කිරීමෙනි* (අමුණුගම, 1999: 53).

ගැමි අර්ථක්‍රමය තුළ ගැමියන් සතු ව පවතින කුඹුරු ඉඩම් පිළිබඳ වැඩිදුරටත් පැහැදිලි කරන ජයන්ත පෙරේරා,

> *ගැමි ආර්ථිකය තුළ වැව (reservoir) වටිනා කාර්යභාරයක් ඉටු කරනු ලැබූ අතර පුරාණ ගැමියන් වැව කේන්ද්‍රකර ගනිමින් ඒ ගොවිතැනේ යෙදුණි. ඔවුන්ගේ මෙම කුඹුරු ඉඩම් කොටස් පංගු (Shares) ලෙස හැඳින්වූ අතර මෙම සියලුම පංගු පුරාණ වෙලකට අයත්ව තිබුණකි* (Perera, 1985:17) යැයි සඳහන් කරයි.

කුඹුරු ඉඩම් කෙත්වතු වශයෙන් ද හැඳින් වූ අතර සෙල්ලිපිවල දක්වෙන ආකාරයට කුඹුරු යායවල්, කුඹුර, කෙත, විය යන නම්වලින් ද හඳුන්වා තිබේ. කුඹුර ලෙස ප්‍රයෝජනයට ගත් භූමි ප්‍රදේශයේ වී වගා කිරීම ක්‍රි.පූ. 4,000 දී පමණ චීනයේ හා ඊසාන දිග ඉන්දියාවේ ආරම්භ වූ අතර ශ්‍රී ලංකාවේ මල්වතු, දැදුරු, කලා නිම්න හා මහවැලි ගංගා නිම්නය ඔස්සේ මුලු දිවයින පුරා ව්‍යාප්ත වූ ප්‍රධාන බෝගය බවට ද පත් ව තිබේ (ගුණවර්ධන 2004:47).

පුරාණයේ වියළි කලාපයේ ඇතැම් පෙදෙස්වල පැවති ආර්ථික සමෘද්ධිය කෙ තරම් ද යත් 'පිටදඬහස', 'අකලහස' හා 'මැදහස' යනුවෙන් වර්ෂයකට කන්න තුනක් වගාකළ බව සඳහන් ව තිබේ. මේ පිළිබඳ පැහැදිලි කරන එල්ලාවල අවිනිශ්චිත අහස් දියෙන් හා වැව් දියෙන් ගොවිතැන් කරන උතුරු මැද පළාතේ ඇතැම් ගම්වල මේ තුන් ආකාරයේ අස්වනු ක්‍රමය 1960 ගණන් දක්වා ක්‍රියාත්මක වූ බව (එල්ලාවල 1964:119) පෙන්වා දෙයි. ඊසාන දිග මෝසම් සුළං ආධාරයෙන් මහ කන්නය වගා කරන අතර එය 'පිටදඬහස' යනුවෙන් හැඳින් වී ය. නිරිත දිග මෝසම් සුළං ආධාරයෙන් යළ කන්නය වගා කළ අතර එය 'අකලහස' වී ය. තුන් වෙනි වාරය වූ මැදහස වර්ෂයේ මැද වගා කරන ලදී.

කුඹුරක විවිධ බෙදීම් ද දක්නට ලැබුණි. වැවට සමීප ව පිහිටි ප්‍රධාන යාය 'මුල්පොට' යනුවෙන් ද ඊට පහළින් වූ කොටස 'හැරෙනපොට' ලෙස ද, අවසාන කොටස 'අස්වැද්දුම් පොට' යනුවෙන් ද හැඳින් විණි (පීරිස් 1964:245). මේ ලෙස කුඹුර බෙදීම සම්බන්ධ සම්ප්‍රදාය පුරාණ කාලයේ සිට ම පැවති බව පෙනේ. සෙල්ලිපිවල සඳහන් අන්දමට 'උත්තෙකුඹුර', 'මැද්දෙකුඹුර' හා 'පස්සෙකුඹුර' යනුවෙන් බෙදීමක් ද හඳුනාගත හැකි අතර එය මහනුවර යුගයේ පැවති ඉහත බෙදීම්වලට බෙහෙවින් සමාන බව පෙනී යයි (ගුණවර්ධන 2004:49).

යාල්මාන් කුඹුරු ගොවිතැන් කටයුතු කරන ආකාර තුනක් පැහැදිලි කරයි. පළමු ක්‍රමය වන්නේ ඉඩම් හිමියා තමන්ගේ පවුලේ සාමාජිකයන් සමඟ එකතු වී කුඹුර අස්වැද්දීමයි. නමුත් ඇතැම් අවස්ථාවන්වල දී පවුලට පරිබාහිර වෙනත් අය ද සම්බන්ධ කර ගැනීමක් සිදු වේ. මෙය ඉතා සහයෝගයෙන් සිදුවන අතර අත්තම යනුවෙන් ද හැඳින් වේ. මෙහි දී සිදුවන්නේ එක් අයෙක් තවත් කෙනෙකුගේ කුඹුරක වැඩ කරන අතර ඊට සමාන දින ගණනක් අනෙක් අයගේ කුඹුරේ වැඩට සහභාගි වීමයි. මීට අමතර ව සාම්ප්‍රදායික ව කුඹුරු ඉඩම් අස්වැද්දීමේ දී භාවිත කළ කයිය නැමති ක්‍රමය ද යොදා ගනු ලැබේ. මෙහි දී සිදුවන්නේ ගැමියන් ගොවිතැන් කටයුතුවල දී සහයෝගයෙන් ඔවුනොවුන් ගේ ශ්‍රමය හුවමාරු කරගැනීමයි.

දෙ වන ක්‍රමය වන්නේ කුඹුරු අස්වැද්දීමේ දී සියලු කටයුතු කුලී කම්කරුවන් යොදවා සිදු කිරීමයි. මෙහි දී ඉඩම් හිමියා සම්බන්ධ නොවන අතර කුලී ශ්‍රමිකයන් වෙනුවෙන් ශ්‍රමයට සරිලන වැටුපක් ගෙවනු ලැබී ය.

තෙ වන ක්‍රමය වන්නේ කුඹුර අස්වැද්දීම සඳහා ඉඩම වෙනත් අයට බදු දීමයි. මෙය 'අඳය' (ande) යනුවෙන් හඳුන්වන අතර මෙය විවිධාකාරයෙන් ක්‍රියාත්මක වි ය. අඳය තුළ ඉතා වැදගත් කොටස් ලෙස ඉඩම්, ශ්‍රමය, බීජ, හා ගවයන් පෙන්වා දිය හැකි ය. අඳය ක්‍රියාත්මක වන එක් ආකාරයක් වන්නේ ඉඩම්

හිමියා විසින් ඉඩම් ද, අඳ ගොවියා විසින් ශ්‍රමය, බීජ හා ගවයන් යොදා ගනිමින් ගොවිතැන් කිරීමයි. මෙහි දී අස්වැන්න දෙදෙනා අතර සමාන ව බෙදී යයි. මීට අමතර ව ඉඩම් හිමියා විසින් ඉඩම්, බීජ හා ගවයන් ලබා දී අඳ ගොවියා විසින් ශ්‍රමය පමණක් යොදා ගොවිතැන් කිරීමේ දි අස්වැන්නෙන් 4/3ක් ඉඩම් හිමියා විසින් සතු කර ගැනීම සිදු වි ය (Yalman 1967:44).

අඳය පිළිබඳ වැඩිදුරටත් විග්‍රහ කිරීමේ දී එය ඉඩම් හිමියා සහ අඳ ගොවියා අතර ඇති ඉතා සංකීර්ණ සම්බන්ධතාවක් ලෙස (Perera 1985:24) හඳුනාගත හැකි වේ.

කුඹුරු ඉඩම් භුක්තිය පිළිබඳ ව තවදුරටත් විග්‍රහ කිරීමේ දී, තට්ටුමාරු හා කට්ටිමාරු ක්‍රමය ද හඳුනාගැනීම වැදගත් වේ. මෙහි දී මුල් පරම්පරාවක් (මී මුතු පරම්පරාවක්) සතු මුල් ඉඩම පවුලේ දරුවන් අතර සමාන ව කොටස්වලට බෙදනු ලැබේ. මෙම ඉඩම් කොටස් වගා කිරීමේ දී එකිනෙකා අතර හුවමාරු වීමක් මෙහි දී සිදු වේ. මේ පිළිබඳ වඩාත් පුළුල් විග්‍රහයක් කරන ඔබේසේකර මෙ සේ සඳහන් කරයි.

> කිසියම් මී මුතු පරම්පරාවක කෙනෙකුට A හා B වශයෙන් දරුවන් දෙදෙනෙකු ඇතැයි උපකල්පනය කොට ඔහුගේ ඉඩම් එම දරුවන් දෙදෙනාට සමාන කොටස් දෙකට බෙදනු ලබයි. එම ඉඩම් කොටස් දෙක ඉහළ කට්ටිය හා පහළ කට්ටිය වශයෙන් නම් කර ඇති විට එක් කන්නයක දී A ඉහළ කට්ටිය වගා කරන අතර, B පහළ කට්ටිය වගා කරයි. නමුත් ඊළඟ කන්නයේ දී A පහළ කට්ටිය වගා කරන අතර B ඉහළ කට්ටිය වගා කරයි. මේ ආකාරයට ඉඩමේ භුක්තිය මාරුවෙන් මාරුවට වගා කිරීම තට්ටුමාරු නම් වේ. නමුත් මෙය පරම්පරා කිහිපයක් දක්වා විකාශනය වීමේදී ඉතා සංකීර්ණ ආකාරයක් ගනු ලබන බව ඔහු වැඩිදුරටත් පෙන්වා දේ (Obeyesekere 1967:18-21).

ඉඩම් පංගු පවුලේ සාමාජිකයන් අතර බෙදීයාම හා මාරුවෙන් මාරුවට වගා කිරීම හේතු කොටගෙන තට්ටුමාරු ගොවිතැන් ක්‍රමය බිහි වූ බව ජෝන් පියර්ගේ විග්‍රහයක් පදනම් කරගෙන රැල්ප් පීරිස් මෙසේ පැහැදිලි කරයි.

> *සමහර විට දේපල භුක්තිය තට්ටුමාරු ක්‍රමය අනුව සිදුවිය. දේපල හැම තට්ටුමාරු පංගුකාරයෙකුටම සමානව ලැබෙන සේ සමාන කොටස් රාශියකට බෙදන ලදි. අනතුරුව ඇත්ත වශයෙන්ම ක්‍රමානුකූල බෙදීමක් කරනු වෙනුවට හා සෑම කොටස්කරුවෙකුටම ඔහුගේ නියමිත කොටස බෙදා වෙන්කර දෙනු වෙනුවට සම්පූර්ණ ඉඩම ඒ ඒ පුද්ගලයාට අයත් කොටස්වලට සමාන කාල සීමාවකට බුක්ති විඳීමට සලස්වන ලදී. ඔහුගෙන් පසු ඊළඟට සිටින තැනැත්තාට ඉඩම් භුක්තිය ලැබේ. ඔහුද ඔහුට නියමිත කාල සීමාව අවසන් වනතුරු එය භුක්ති විඳී. මේ ආකාරයට කොටස් හිමි සියලු දෙනාටම වාරයක් ලැබේ. මෙසේ ඒ, බී, හා සී ට නොබෙදූ කුඹුරකින් පිළිවෙළින් මුළු කුඹුරෙන් සමානුපාතිකන කොටස් 2, 3 සහ 4 එනම් 2/9, 1/3, සහ 4/9 අයත් වී නම් 'ඒ ' මුළු කුඹුරම අවුරුදු 2 ක්ද එයින් පසු 'බී' මුළු කුඹුරම අවුරුදු 3 ක්ද ඔහුගෙන් පසු 'සී' මුළු කුඹුරම අවුරුදු 4 ක්ද වශයෙන් භුක්ති විඳී. මේ අන්දමින් යම්කිසි පංගුකාරයෙකු ඇත්ත වශයෙන්ම කුඹුර බෙදීමට යෝජනා කරනතුරු අවුරුදු නවයේ කාලසීමාව තුළ ඉහත දක්වූ පරිදි ඒ ඒ තැනැත්තාගේ වාරය නැවත නැවත එළඹේ* (පීරිස් 1964:52).

ඉහත සියලු විග්‍රහයන්ට අනුව ඉඩම් භුක්තිය තුළ තට්ටුමාරු ක්‍රමය ඉතා සංකීර්ණ ස්වරූපයක් ගන්නා බව පැහැදිලි වේ.

ගැමියන් සතු ඉඩම් පිළිබඳ විග්‍රහයේ දී ගොඩ ඉඩම්වලට ද වැදගත් තැනක් හිමි වේ. පදිංචි වී ඇති වත්ත හෙවත් වතු ගෙවත්ත යනුවෙන් ද හඳුන්වනු ලැබේ. ගෙයක් අවට පළතුරු, පොල්, පුවක්, කෙසෙල් හා අඹ ආදී ගස්වලින් සමන්විත වන්නේ 'වත්ත' බව එම්. බී. ආරියපාල සඳහන් කරයි (1969:74) සීගිරිය ආශ්‍රිත ගම්මානවල ගෙවත්ත තුළ ප්‍රධාන වශයෙන් දැකිය හැක්කේ හරක්මඩුව, කරත්ත මඩුව හා වී බිස්ස බව (ගුණවර්ධන, 2004:51) සඳහන් කරයි. ගෙවත්ත පිළිබඳ ව පීරිස් සඳහන් කරන්නේ, වතු හා හේන් ඇතුළු ගොඩබිමකින් සෑදුණු අඩු.තු දේවල් සෑම ගම්

වසමක ම පිහිටි කුඹුරු වලට සම්බන්ධ ව තිබුණු බවයි. මෙම කුඹුර හා අඩුත්තු දේවල් පවුලක මූලික අවශ්‍යතා, එ නම්, වී, පොල්, එළවළු, බුලත්, පුවක්, දර, තණබිම්, පැණි හා දඩමස් ද සැපයූ බවයි (පීරිස් 1964:41). කොඩ්රිංටන් පවසන අන්දමට උයන්වතු, පදිංචිය ඇති වත්ත හෙවත් ගෙවත්ත හා වතු යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකි වේ. එහෙත් උයන්වතු යනු රාජකීය හෝ විහාර සතු වත්තක් මිස ගෙවත්ත සඳහා භාවිත කරන්නක් නොවේ (කොඩ්රිංටන් 1980:11).

හේන් ගොවිතැනට ද ග්‍රාමීය ආර්ථිකය තුළ වැදගත් තැනක් හිමි වේ. හේන් සඳහා ගම වටා තිබූ කැලෑ භූමිය ගැමියන් විසින් ප්‍රයෝජනයට ගනු ලැබී ය. හේන් ගොවිතැන සම්බන්ධ ඉතිහාසය දුටුගැමුණු රජුගේ යෝධයෙකු වූ ගෝඨයිම්බර හා සම්බන්ධ තොරතුරු දක්වා අතීතයට දිවේ. ඔහු ඇතුළු සහෝදරයන් හය දෙනා කැලයට ගොස් ගස් කපා දමා බෝංචි හේනක් වගා කළ ඓතිහාසික සටහන්වල දැක් වේ (එල්ලාවල, 1964:120-125). නුවර කලාවිය තුළ 17 වන ශත වර්ෂයේ දී බහුල ව දක්නට ලැබුණු හේන් ගොවිතැන ග්‍රාමීය අර්ථ ක්‍රමයේ වැදගත් තැනක් ගත් බව පීරිස් සඳහන් කරයි. (පීරිස් 1964:47). හේන් ගොවිතැන ගැන තවදුරටත් සඳහන් කරන ඔහු,

> *සුදුසු භෝග තෝරා ගත්තේ කැළෑවේ ස්වභාවය අනුවය. කුඩා ගස් කපා පිළියෙල කරගත් නවදැලිහේන් විශේෂයෙන් කුරහන් වැනි කුඩා ධාන්‍ය වර්ග සඳහා යෝග්‍යය. රූස්ස ගස්වලින් යුත් මූකලාන් හේන් මිරිස් වැනි එළවළු සඳහා යෝග්‍ය විය. නියර හේන් මෙනේරි හා කුරක්කන් සඳහා තෝරාගත් විශේෂ කැළෑ භූමියෙකි* (පීරිස් 1964:47).

මෙම හේන් ඉඩම් හැඳින්වීම සඳහා වල් හෙවත් වල්පිට, රත්මාසර හෙවත් රත්මහර යන්න ද භාවිත වේ (කොඩ්රිංග්ටන් 1980:11).

හේන් ඉඩම් සඳහා අයිතියක් ඒවා වගා කළ ගොවීන්ට නොතිබුණි. ඒවා රජයේ හෝ ගමේ ජනතාවගේ ඉඩම් වශයෙන් සලකන ලදී. රජයේ නිලධාරීන්ගෙන් හෝ ගම් ප්‍රධානීන්ගේ අවසරය මත ඒවා වගා කිරීමට ගැමියනට පුළුවන. එ මෙන් ම පුරාණ කාලයේ හේන් ඉඩම් සඳහා බදු පැන වූ බව (ගුණවර්ධන 2004:55) සඳහන් වේ. කෙ සේ වෙතත්, බ්‍රිතාන්‍යය පාලන සමය තුළ හඳුන්වා දෙන ලද 1897 අංක 1 දරන මුඩු බිම් ආඥා පනත වැනි පනත් මගින් ගැමියන් සතු හේන් ඉඩම් රජයට පවරා ගෙන එම ඉඩම් වතු වගාවන් සඳහා යොදා ගැනීම ගැමි ආර්ථිකයට සෘජු ලෙස බලපෑ බව (අයිවන් 1999:118) සඳහන් වේ.

ගැමි අර්ථ ක්‍රමය තුළ ඉඩම් භුක්තිය තවදුරටත් හඳුනා ගැනීමේ දී ඉඩම් වර්ග කිරීම පිළිබඳ ව ද අවධානය යොමු කිරීම වැදගත් වේ. ලංකාවේ ඉඩම්, ඒවායේ කෙරෙන වගාව අනුව ද, අස්වැන්න බෙදීම අනුව ද, ඒවා හිමි තැනැත්තාට ඒ පිළිබඳ ඇති අයිතිය අනුව ද වර්ග කළ හැකි ය (කොඩ්රිංග්ටන්, 1980:10).

1. වගාව අනුව ඉඩම් වර්ග කිරීමේ දී

I. කෙත් : වී වගා කෙරෙන කුඹුරු මේ නමින් හැඳින්වෙන අතර වගා නොකෙරෙන කෙත් පුරන් කෙත් හෝ බලන් කෙත් නම් වේ.

II. උයන්වතු : පදිංචිය ඇති වත්ත හෙවත් ගෙවත්ත මින් හඳුන්වනු ලැබේ.

III. හේන් : කැළෑ එළිකොට පුළුස්සා කාලයෙන් කාලයට වගා කෙරුණු උස්බිම් මේ නම් වේ.

2. අස්වැන්න බෙදීම අනුව වර්ග කිරීමේ දී,

I. නින්ද : තමාගේ ම විශේෂ අයිතිය ඇති අන් අයට අයිතිය පැවරිය නොහැකි ඉඩම් නින්ද වශයෙන් හැඳින් වේ. මෙහි දී බෝගය සම්පූර්ණයෙන් ම ඉඩම අයිතිකරුවාට හිමි වේ.

II. අඳය : ඉඩම අයිතිකරුට අස්වැන්නෙන් කොටසක් ද වගා කරන්නාට ඉතිරි කොටස ද හිමි වේ. අඳය විවිධාකාරයෙන් ක්‍රියාත්මක වේ.

III. ඔතු : මෙය තුන් ආකාරයකට දක්නට ලැබේ.

a. වපසරියට සමාන අස්වැන්නෙන් කොටසක් හෝ සමහර කුඹුරුවලින් හා හේන්වලින් වපසරිය මෙන් එකහමාරක් හෝ දෙ ගුණයක් පමණ

b. සරුවට වැඩුණු කුඹුරකින් හෝ හේනකින් ගෙවන ලද අස්වැන්නෙන් කොටස

c. හේනක අයිතිකරුවකු හැර අනෙකකු විසින් කටුසර බෝග වපුළ හේනක පැසුණු අස්වැන්නෙන් මුලින් ම ගන්නා කොටස

3. අයිතිකරු බුක්ති විඳි අයිතිය අනුව වර්ග කිරීමේ දී,

I. පරවේණි : පරම්පරාවකින් උරුමවන අයිතිය මේ නමින් හැඳින් වේ. ප්‍රවේණි යනුවෙන් ද භාවිතයේ පවතී.

II. මාරුවෙන අයිතිය : මෙය පරවේණියට විරුද්ධ අදහසක් ගනු ලබයි. බොහෝ විට කැමැත්ත අනුව බුක්තිය මේ නමින් නිර්වචනය වේ.

ඉහත පරවේණි ඉඩම් තවදුරටත් හඳුනා ගැනීමේ දී අඳ පරවේණි, අස්වද්දු පරවේණි, ඔතු පරවේණි, ඔතු කුඹුරු පරවේණි, ඕවිටි පරවේණි, කණු ඉස් පරවේණි, සහ කරුදෙන පරවේණි යනුවෙන් ද විවිධාකාරයෙන් හඳුනාගත හැකි වේ (කොඩ්රිංග්ටන් 1980:10-17).

සිංහල ගැමි අර්ථ ක්‍රමය තුළ ගැමියන් ප්‍රධාන වශයෙන් ම තම ඉඩම් කුඹුරු, ගොඩ ඉඩම් හා හේන් වශයෙන් යොදා ගත් බව පැහැදිලි වේ. මෙම ඉඩම් භුක්ති විඳීමේ දී විවිධ ක්‍රම අනුගමනය කළ බව ද හඳුනාගත හැකි ය. විශේෂයෙන් කිවයුතු වන්නේ කෘෂිකර්මාන්තය ප්‍රධාන ධනෝපායන මාර්ගය වූ හෙයින් සිංහල ගැමි අර්ථ ක්‍රමය තුළ ඉඩම්වලට වැඩි වටිනාකමක් හිමි ව ඇති බවයි.

## සාම්ප්‍රදායික අවධිය සහ ඉඩම් භුක්තිය

සිංහල ගැමි අර්ථක්‍රමය සහ ඉඩම් භුක්තියේ ස්වරූපය විග්‍රහ කිරීමේ දී ලංකාවේ පුරාණ ඉඩම් භුක්තිය පිළිබඳ ව ද අවධානය යොමු කළ යුතු ව ඇත. අධිරාජ්‍යවාදීන් මෙ රටට පැමිණීමට පෙර දේශීය රාජ්‍යත්වය තුළ ඉඩම් භුක්තිය, රාජ්‍ය පාලන තන්ත්‍රය සමඟ දැඩි ව සම්බන්ධ වී තිබුණි. භූමියේ පූර්ණ අයිතිය රජතුමා සතු වී ය. මේ පිළිබඳ ව විග්‍රහ කරන ආර්ය අබේසිංහල රජතුමා, භූපති, පෘථිවියේ ස්වාමියා හෙවත්, භූපාල, පෘථිවියේ ආරක්ෂකයා වූ අතර සියලු දෙනාගේ ක්ෂේත්‍රයන්හි අධිපතියා ද වූ බව සඳහන් කරයි (Abeysinghe 1978:32).

ඉඩම් සම්බන්ධයෙන් පරම අයිතිය රජු සතු ව තිබූ අතර ඉඩම් ප්‍රදානයේ මූලිකයා වූයේ ද ඔහු ය. රාජ්‍ය තුළ වූ ඉඩම් අතරින් කොටසක් රජ පවුලේ ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලදී. මේවා, ගබඩාගම්, නමින් හැඳින් විණ. බිසවට අයත් වූ ගම්, බිසෝගම් වි ය. නුවර යුගයේ දී රජුගේ ප්‍රධාන භාණ්ඩාගාරය එ නම්, මහවාසල ගබඩාව, හැරෙන්නට ඔහුගේ පෞද්ගලික භාණ්ඩාගාරය (උප ගබඩාව ද) බිසෝවරුන්ගේ හා කුමාරවරුන්ගේ භාණ්ඩාගාරය ද (පල්ලේවාහල ගබඩාව) ද අයත් ව තිබූ බව (පීරිස් 1964:49) සඳහන් වේ. ඒ අතර පූජ්‍යස්ථාන හා පැවිද්දන් ගේ යැපීම සඳහා සමහර ගම් බිම් වෙන් කර දී තිබිණ. මේවා, විහාර ගම්, වශයෙන් හඳුන්වන ලදී. මීට අමතර ව රජුට සේවය කළ නිලධාරීන් ගේ යැපීම සඳහා එම සේවයට අනුග්‍රහයක් වශයෙන් වැටුපක් වශයෙන් ගම් බිම් ප්‍රදානය කිරීමක් සිදු වි ය. ඉඩම් සම්බන්ධයෙන් කෙනෙකුට පූර්ණ අයිතිය ලැබුණේ ඒ සඳහා ඉටුකළ යුතු වූ අනිවාර්ය රාජකාරී සේවාව මතයි. රාජකාරී සේවාව බුලත් හුරුල්ලක් පිදීමේ චාරිත්‍රානුකූල සේවයේ සිට කුඹුරු කෙටීම හා බර රැගෙන යාම වැනි ඉතා දුෂ්කර ශ්‍රමික කාර්යයන් දක්වා විවිධාංගීකරණය වි ය. රාජකාරී සේවාව සම්බන්ධයෙන් පැහැදිලි කරන පීරිස් (1964:44) ඉඩකඩම් අරභයා වූ ප්‍රවේණි අයිතිය, නිත්‍ය උරුමයට හිමිකම ලැබෙන්නා වූ ද පුද්ගලයෙකුට නීත්‍යානුකූල ව ලබාගත හැකි වූ ද, උසස් ම දේපල හිමිකම වි ය. එහෙත් අවස්ථා කිහිපයක් හැරෙන්නට මෙකී ඉඩම සඳහා ද පෞද්ගලික සේවාවන් හෝ මුදලින් නැතහොත් ද්‍රව්‍යවලින් ගෙවීමක් හෝ කළ යුතු වි ය. මෙය රාජකාරිය නමින් හැඳින් විණි.

සේවයක් බලාපොරොත්තුවෙන් රජතුමා විසින් අතහැර දමූ හෝ උරුමක්කාරයකු නොමැති ඉඩම් කැබලි වෙනත් අයට පැවරිණි. එ වැනි පැවරුමක් ලැබූ අය පංගුකාරයා වශයෙන් හැඳින් වි ය. මීට අමතර ව විශේෂ සේවා වෙනුවෙන් ගම්වර ප්‍රදානය කෙරිණි. රජුගේ ගබඩාවේ හෝ විහාරයක, දේවාලයක හෝ රාජ්‍ය නිලධාරියකු ගේ ප්‍රයෝජනය සඳහා ඉඩම් ලබා දෙන විට ගමක් සම්පූර්ණයෙන් ම ලබා දී තිබේ. මුල දී සඳහන් කළ පරිදි රජුගේ ගබඩාවේ ප්‍රයෝජනය සඳහා වෙන් වූ ගම්, ගබඩාගම් වූ අතර විහාරයක හෝ දේවාලයක ප්‍රයෝජනය සඳහා වෙන් වූ ගම්, විහාර ගම් හෝ දේවාල ගම් නමින් හැඳින් විණ. නිලයකට අයත් ප්‍රසාදයක් වශයෙන් ලැබූ ගම්, නින්ද ගම් වශයෙන් හඳුන්වනු ලැබී ය. මේ පිළිබඳව විග්‍රහ කරන පීරිස් (1964,58).

*නින්දගම් රජු විසින් පුද්ගලයෙකුට පවරනු ලැබූ රාජකීය ගමය. එවැනි*

*ගම්වල ඉඩම් පංගු හිමි පුද්ගලයෝ කලින් තමන් විසින් රජුට ගෙවූ බදු හා ඉටු කළ රාජකාරිය හා එයින් පසු, ගම්ලද්දා හෙවත් නින්දගම් හිමියා වෙනුවෙන් ඉටු කළහ. මෙලෙස නින්දගම් හිමියා හෙවත් ගම්ලද්දා මුත්තෙට්ටුවේ භුක්තියට හිමිකරු විය. මුත්තෙට්ටුව යනු ප්‍රදාන ලාභියා සඳහා පංගුකරුවන් පොදුවේ එක් වී වගාකළ සරුසාර ඉඩම් කොටස් විය.* (සිල්වා 1998,24)

මෙම මුත්තෙට්ටු ඉඩම් අයිතිය ගම්ලද්දා සතු වූවත් ඔහුට, චාරිත්‍රානුකූල ව ගැමියන් ගේ සේවාව ලබා ගැනීම හැරෙන්නට ගමේ වෙනත් ඉඩම්වලින් පස් උදුල්ලක්වත් අයත් නොවී යැයි (පීරිස් 1964:61) පෙන්වා දී ඇත. නින්දගම් අයිතිය පරපුරෙන් පරපුරට හිමි අතර සෑම විට ම නින්දගම් හිමියා වැසියන්ගේ අනිවාර්ය සේවාවලට ද හිමිකම ලැබී ය.

මීට අමතර ව රජයේ උසස් තනතුරුවලට සුදුස්සන් පත්කිරීමේ අයිතිය රජතුමා සතු වි ය. උසස් තනතුරු වෙනුවෙන් සේවා පරවේණි ඉඩම් ප්‍රදානය කළ අතර ඒවායේ අයිතිය පරපුරෙන් පරපුරට උරුම වි ය. මෙම ඉඩම්, නිල පංගු, නමින් හැඳින්විය. නිලය දරන කාලය තුළ පමණක් මෙම නිල පංගුවල අයිතිය තිබූ අතර නිලය අහෝසි වීමත් සමඟ ඉඩම් අයිතිය ද නැති වී යයි. එ සේ අහිමි වන නිල පංගු ඊළඟ අනුප්‍රාප්තිකයාට හිමි වි ය. මෙම නිලපංගුව හෙවත් පරවේණි ඉඩම ලැබූ අය වර්ෂයකට වරක් තුටු පඬුරු රැගෙන රජු හෝ උසස් මුලාදෑනීන් බැහැ දැකිය යුතු අතර එලෙස ගෙන යන තුටු පඬුරු, දැකුම් කද, යනුවෙන් හැඳින් විණ.

රජතුමා විසින් මෙම ඉඩම් පවරා දුන් ආකාරය විමසා බැලීම ද වැදගත් වේ. රාජකීය ඉඩම් පවරා දීම ප්‍රධාන වශයෙන් කට වචනයෙන් හෝ සන්නසක් මගින් හෝ සිදු වී තිබේ. මේ පිළිබඳ විග්‍රහ කරන කොඩ්රිංටන්, ඉඩම් පවරාදීම පිළිබඳ නිත්‍ය වාර්තා තිකුත් කිරීම ඇරඹුවේ නිශ්ශංකමල්ල රජු බවත් මෙය, සත්හස, හෙවත්, සන්නස, ලෙස සිංහලෙන් හැඳින්වෙන අතර පදගතාර්ථයෙන්, අත්සන සහිත මුද්‍රාව, ලෙස හැඳින්විය හැකි බව සඳහන් කරයි (කොඩ්රිංටන් 1980:40).

කටවචනයෙන් ඉඩම් පැවරීම සිදු වී ඇත්තේ කැට සාක්කියක් සංකේතාත්මක ව ඉඩම් ලබන්නාට දීමෙනි. මෙම කැට සාක්ෂි වශයෙන් මුදුවක්, හක් ගෙඩියක්, වළලු ජෝඩුවක් යනාදිය ඉඩම් ලැබුම්කරුවාට දීම සම්ප්‍රදාය වි ය.

සන්නස් පත්‍රයක් මඟින් ඉඩම් පැවරීමේ දී එය තල්පතක ලියා ඇත්නම් තුඩපත නමින් හඳුන්වා ඇති අතර එම තල්පත දිරාගොස් හෝ සතුන් කා හෝ ඇති විටක හිමිකරු විසින් රජුගේ භාණ්ඩාගාරයට රිදී එකක් ගෙවා තල්පතක් වෙනුවට තඹපතක් ලබාගත හැකි වි ය.

මෙම රාජකීය ඉඩම් රජු ඉදිරියේ ප්‍රදානය කිරීමක් අවශ්‍ය නොවූ අතර අධිකාරමගෙන් එය ලබන තැනැත්තා ඒ අවස්ථාවේ රජු ඇතැයි සිතන කාමරය දෙසට මුහුණලා දණින් වැටී නමස්කාර කිරීම සාමාන්‍ය සිරිත වි ය (පීරිස් 1964:56).

අධිරාජ්‍යවාදීන් මෙ රටට පැමිණීමට පෙර යුගයේ මේ රටේ ක්‍රියාත්මක වූ ඉඩම් භුක්තිය රජුගේ පූර්ණ බලපෑම මත ක්‍රියාත්මක වූවකි. මෙහි දී ඉඩම් භුක්තිය හා අනිවාර්ය රාජකාරී සේවාව අතර දැඩි සම්බන්ධතාවක් ඇති ව ක්‍රියාත්මක වූ බව පෙනේ. රජතුමාගේ ස්වාමීත්වය හැරෙන්නට බිමේ අවසාන අයිතිය රජතුමා සතු වූ අතර ලැබෙන ආදායම ද ඔහුට අයත් වි ය. යම් ආකාරයකින් රජුට ලැබෙන ආදායම හෝ සේවාව පැහැර හරින්නේ නම් ඉඩම්ලාභියා ඔහුගේ බිම් කැබැල්ලෙන් ඉවත් කිරීමට රජතුමාට හැකි වි ය. රජතුමා සතු ව පැවති මෙම අයිතිය විග්‍රහ කරන කොඩ්රිංටන් (1980:27),

*පුරාණයෙහි සිට අද දක්වා රජකළ රජවරු මෙම ඉඩම් තමන් කැමති කෙනෙකුට පිරිනැමූහ. එම ඉඩම් පිරිනමනු ලැබූ අය කිසියම් රෝගයක් නිසා හෝ සිය මාළිගය මුරකිරීමට පැමිණිය නොහැකි වූවහොත්, නොඑසේ නම්, ඔවුන්ට යුද්ධයට යාමට නොහැකි වුවහොත් ඒ රජවරුන්ට ඉහත සඳහන් ඉඩම් ආපසු ලබා ගැනීමට හැකි වි ය.*

මේ අන්දමට රජුගේ අයිතිය යටතේ ක්‍රියාත්මක වූ මෙ රටේ ඉඩම් භුක්ති ක්‍රමය අධිරාජ්‍යවාදීන් ගේ ග්‍රහණයත් සමඟ කිසියම් ආකාරයක වෙනස් මඟක් ඔස්සේ ක්‍රියාත්මක වූ බව කිව හැකි ය.

## අධිරාජ්‍යවාදී පාලන සමය සහ ඉඩම් භුක්තිය

### පෘතුගීසී පාලන සමයේ ඉඩම් භුක්තිය

පෘතුගීසි පාලන සමය තුළ මේ රටේ ඔවුන්ට අයත් ව තිබූ ප්‍රදේශවල ඉඩම් භුක්තියේ සැලකිය යුතු වෙනස්කම් රාශියක් හඳුනාගත හැකි ය. පෘතුගීසීන් විසින් කෝට්ටේ රාජ්‍යයේ බලය අල්ලා ගැනීමත් සමඟ ඉඩම් භුක්තිය සම්බන්ධ ව විවිධ ක්‍රියා මාර්ගයන් ගනු ලැබිණ. පෘතුගාලයේ රජු විසින් සකස් කළ ඉඩම් ප්‍රතිපත්තියේ ප්‍රධාන මූලධර්මය වී තිබුණේ දේශපාලනික වශයෙන් බලය ලබා ගැනීමයි. මේ නිසා ඉඩම් බෙදා දීමේ දී ආර්ථික කරුණුවලට වඩා දේශපාලනක කරුණු මුල්තැන්හි ලා සැලකූ බව පෙනේ. මේ පිළිබඳ ව පැහැදිලි කරන ටිකිරිබංඩා හේරත් අභයසිංහ,

> රජුන් ඉඩම් ප්‍රතිපත්තිය ක්‍රියාකර වූ දුන්න දඟ දමා තිබුණේ දේශපාලනමය කරුණුවලිනි. වැඩි වියදමක් නොමැතිව උඩරට අල්ලා ගැනීමේ අදහස 1606 - 1607 වර්ෂවල දී පෘතුගීසි අධිකාරීන් අතර තදින් මුල් බැස ගෙන තිබුණු බවත්, තමන්ට ගත හැකි වෙනත් මඟක් නොමැති බව දත් ඔවුන් ඒ නිසා වැඩි ශ්‍රද්ධාවකින් මේ ධර්මය දේශනා කළ බවත් හෙතෙම පෙන්වා දේ (1966:96).

දේශපාලනික වශයෙන් බලය තර කරගැනීමේ අරමුණින් මේ රටේ ඉඩම් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති තීන්දු, තීරණ ගනු ලැබූ පෘතුගීසීන් 1615 පමණ වන විට, අන්තාවෝ වාස් ප්‍රෙයිරේ, (Antavo Vas Freire) නැමති පෘතුගීසි ආදායම් පාලක නිලධාරියා යොදවා සකස් කරන ලද ඉඩම් තෝම්බුව අනුව පෘතුගීසීන් මේ රටේ වැඩි ඉඩම් ප්‍රමාණයක හිමිකරුවන් වීමට සමත් වී ඇති බව පැහැදිලි කරයි. (Abeysinghe1978:67).

මෙම කාල පරිච්ඡේදය තුළ දී රටේ රජතුමා සතු ව තිබූ බලතල යොදාගනිමින් කපිතාන්වරු, දිසාවේවරු හා ප්‍රතිකාල් ප්‍රභූවරුන් වෙත ගබඩාගම් ඇතුළු ඉඩම් ප්‍රදානය කළහ. මේ නිසා 16 වන සියවස ආරම්භ වන විට කෝට්ටේ රාජ්‍යයේ තිබූ ගබඩාගම්වලින් වැඩි කොටසක් පෘතුගීසීන්ට අයත් වි ය. ගබඩාගම් පෞද්ගලික ඉඩම් වශයෙන් ලැබූ පෘතුගීසීන් ඒ වෙනුවෙන් කළයුතු වූ අනිවාර්ය සේවාවන් නොකරන ලදී. මේ හේතුව මත කෝට්ටේ රාජ්‍යය තුළ අනිවාර්ය සේවාවන්ගෙන් බැහැර වූ පෘතුගීසීන් විසින් පෞද්ගලිකව ඉඩමේ ආදායමෙන් 12%ක බිම් බද්දක් අයකිරීමේ ක්‍රමයක් ඇති කරන ලදී. මෙ සේ ඉඩම් හිමියන්ගෙන් බිම් බද්දක් අයකිරීමත් සමඟ එතෙක් කල් ඉඩම් වර්ගකිරීම සඳහා භාවිත වූ ගබඩා ගම්, නින්ද ගම්, පරවේණි ගම් යන වචන බිම් බදු ගෙවූ ඉඩම් සහ, රජයට සේවය සැපයූ ඉඩම් යන වර්ග දෙකෙන් ම තොර වර්ග කිරීමක් සිදු වි ය. ඉඩම් භුක්තියේ ස්වභාවය අනුව ඉඩම් දෙවර්ගයක් තිබූ බව අභයසිංහ (1966:116) පෙන්වා දේ. ඒ නම්, 1. පරම්පරා දෙකක් හෝ තුනක් භුක්ති විඳි පරවේණි ඉඩම් හා 2. රාජාභිමතයට යටත්ව භුක්ති විඳි ඉඩම් වශයෙනි. මීට අමතර ව පෘතුගීසි වංශවත්තු තමන් සතු ව පවතින ඉඩම් ස්වදේශීන් ලවා වගා කර වූහ. 1619 වන විට කෝට්ටේ රාජ්‍ය තුළ පෘතුගීසීන් සන්තකව තිබූ සියලු ඉඩම් පෞද්ගලික ඉඩම් වශයෙන් වගා කටයුතු කළ යුතු අනිවාර්ය සේවාවන්ගෙන් ද නිදහස් ඉඩම් වි ය. පෙර පැවති රාජාණ්ඩු ක්‍රමය තුළ රජුන් විසින් යුද්ධ සේවා සඳහා ලබාදුන් සේවා පරවේණි ඉඩම් පෞද්ගලික ඉඩම් බවට පරිවර්තනය වීම නිසා ඇති වූ බලපෑම පැහැදිලි කරන එම්.යූ.ද සිල්වා,

> *සීතාවක රාජසිංහ රජුට 50000 ක භට පිරිසක් කැඳවීමට හැකිව තිබුණි. 1602 වන විට කෝට්ටේ සිංහල හමුදාව 12000 කින් සමන්විත වූ අතර පෘතුගීසි යුගය අවසන් වන විට එය 4700 දක්වා අඩු වී ඇති බව පෙන්වා දේ. මේ තත්ත්වයෙන් මිදීම සඳහා පෘතුගීසීන් විසින් ගනු ලැබූ පියවර වූයේ පරම්පරා තුනක් යුධ සේවාවේ නියැලෙන පදනම මත රජයේ ඉඩම් ලස්කරීන් භටයන් නමින් හැඳින්වූ ස්වදේශීය යුධ භටයන් වෙත ප්‍රදානය කිරීමයි* (1998:25).

ඉහත විග්‍රහ කළ ආකාරයට පෘතුගීසි පාලන සමය තුළ ලංකාවේ ඉඩම් භුක්තිය සම්බන්ධයෙන් විවිධ තීන්දු ගනු ලැබූ අතර මින් පසු ව මෙරටේ පාලන බලය ලබා ගන්නා ලන්දේසීන් යටතේ ක්‍රියාත්මක වූ ඉඩම් ඔවුන්ගේ අවශ්‍යතාවන් අනුව සකස් වන්නට වි ය.

### ලංදේසි පාලන සමයේ ඉඩම් භුක්තිය

ලන්දේසි පාලන සමය තුළ ඔවුන්ගේ පාලනයට නතු වූ ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වූ ඉඩම් භුක්තිය පෙර පැවති සිරිත්විරිත් කුල සම්ප්‍රදායන් ගැන නොසලකා ඔවුන්ගේ ආර්ථික හා දේශපාලනික ව්‍යාපාරයට වැදගත් වන ආකාරයට ගොඩ නගා ගන්නා ලද්දකි.

ලන්දේසීන් විසින් උඩරට ප්‍රදේශ ආක්‍රමණය කොට එහි ජනයා පහතරට ප්‍රදේශවලට ගෙනවිත් ඔවුන්ගේ කැමැත්ත අනුව ඉඩම් ලබාදුන් බවත් එම ඉඩම් සියල්ල රජයට ගෙවන බදු මුදල් වලින් නිදහස් කර තිබූ බවත් (සිල්වා,1988,45) සඳහන් කරයි. ලන්දේසී පාලන කාලය තුළ ඔවුන් යටතේ පැවති ප්‍රදේශවල ඉඩම් අයිතිය ඔවුන් සතුය යන උපකල්පනය මත ලන්දේසීන් විසින් කළ ඉඩම් ප්‍රදානය කිරීම් නතර කළ අතර රජයට කරණු ලබන සේවා හෝ දීමනා වෙනුවට බද්දක් අයකර ගන්නා ලදී.

මීට අමතර ව ලන්දේසීන් ඔවුන්ගේ පාලන ප්‍රදේශවල ඉඩම් සම්බන්ධයෙන් ඉඩම් තෝම්බුව ද සකස් කරන ලදී. මේ පිළිබඳ විස්තරයක් කරන කරන සිල්වා,

> *ඉඩම් තෝම්බුවේ සටහන් තැබුවේ ගෘහමූලිකයා ගේ නමිනි. පවුල සන්තක සියළු ගොඩ හා මඩ ඉඩම් නම් වශයෙන් සඳහන් කෙරිණි. ඉඩමේ වපසරිය කොස්, පොල්, පුවක් වගාවන් ආශ්‍රයෙන් සටහන් කර තිබූ අතර හිස් ඉඩම්වල වපසරිය වැවිය හැකි ගස් ප්‍රමාණයෙන් දක්වා තිබුණි. වතු බදු හා පොල් අය බදු ද වෙන වෙනම සටහන් කර තිබිණ. කුඹුරු ඉඩම්වල වපසරිය අමුණු , කුරණි ආදී ප්‍රමාණයන්ගෙන් ද ඕවිට, රත්තින්ද, මළපාලු, නිලපාලු, රත්මහර යනා දී විවිධ කාණ්ඩයන් යටතේ ද කෙරිනි. වගාව වගී අනුවද ඔතු හා අඳේ ඉඩමක් ද යන්නද සඳහන් කර තිබිණි. ඉඩම් තෝම්බුවල ඉඩමේ උරුමය පිළිබඳව දෙන විස්තරය ඉතා වැදගත්ය. පරවේණියක් ද , මිල දී ගැනීමක් ද නැතහොත් අනවසරයෙන් වගාකළ රජයේ ඉඩමක්ද යන්න සටහන් කෙරිණි. තවද එම පවුල කල සේවාව ඉඩම් අයිතිය මගින් අවබෝධ කර ගත හැක* (1998:48).

මෙ සේ ඉඩම් තෝම්බු සකස් කළ ද ඉඩම් හිමිකම තහවුරු කිරීමට ඔප්පු, සිට්ටු, සන්නස් බොහෝ දෙනෙකුට නොතිබුණි. වගා කළ සෑම ඉඩමක් ම කිසියම් රාජකාරී සේවාවක් වෙනුවෙන් හිමි වී තිබූ සේවා පරවේණි ඉඩම් වි ය. මීට අමතර ව මුලාදෑනීන් ගේ යැපීම වෙනුවෙන් දුන් "ඇකොමොදේසාන්ස්" නමින් හැඳින් වූ විශාල ඉඩම් ප්‍රමාණයක් ද ගම්වල තිබිණි. කෙසේ වෙතත් භුක්තිය තහවුරු කිරීමට ලිඛිත සාක්ෂි නොමැති වූ විට බොහෝ ඉඩම් රජයේ ඉඩම් සේ ලියාපදිංචි කරන ලදී. තෝම්බු සකස් කිරීමත් සමඟ වගා නොකළ හා කැළෑ ඉඩම් රජයේ ඉඩම් සේ ප්‍රකාශ කරමින් අනවසරයෙන් ඒවා වගා කිරීම දඩුවම් ලැබිය හැකි වරදක් සේ ප්‍රකාශ කරන ලදී. රජයෙන් කළ ඉඩම් ප්‍රදාන ක්‍රමය අක්‍රීය කළ ඔවුහු ඉඩමේ පූර්ණ අයිතිය ඉඩම් හිමියාට ලබා දී ඒ වෙනුවට බද්දක් අයකර ගැනීමට කටයුතු කළහ. මේ නිසා මින් ඉදිරියට ඉඩම් හිමියාට තමන්ට රිසිසේ ඉඩම විකිණීමට, බදු දීමට, අඳේට පැවරීමට හෝ ණයට බදු දීමට හැකියාව ලැබුණි. මේ ආකාරයට ඉඩමේ පෞද්ගලික අයිතිය තහවුරු කිරීම තුළ ඉඩම් භුක්තිය මූලික වෙනසක් සිදු කරන ලදී.

මීට අමතර ව ලන්දේසී පාලන සමය තුළ තම ප්‍රදේශවල ඉඩම් ප්‍රදානය සඳහා අලුත් ක්‍රමයක් ආරම්භ කරන ලදී. මෙම ඉඩම් ප්‍රදානය, තුන් හවුල් ඉඩම් (සිල්වා 1998:63) වශයෙන් හඳුන්වනු ලැබී ය. මෙ ලෙස ප්‍රදානය කළ ඉඩම් වලින් 1/3ක ප්‍රමාණය ඕලන්ද සමාගමේ නියෝජනය සඳහා ගම්මිරිස්, එනසාල්, කෝපි හා කුරුඳු වගාවන් වෙනුවෙන් වෙන් කරනු ලැබී ය. මෙම වගා කිරීම් සඳහා කිසිදු ගෙවීමක් සිදු නොකළ අතර ඉඩමේ අනෙක් 2/3 ඉඩම් හිමියාට කැමති වගාවක් සඳහා යොදා ගත හැකි වි ය. නමුත් මුලාදෑනි බලපෑම් මත මෙම කොටසේ නිෂ්පාදනය ද නිශ්චිත මුදලකට සමාගමට විකිණීමට බල කෙරුණි. එ සේ ම මෙම ඉඩම්වල අයිතිය වැඩි වශයෙන් ගම්වල ප්‍රධානීන් සතු වූ නිසා ගම්වල ප්‍රබලයන්ගේ තත්ත්වය වර්ධනය වී ඉඩම් හිමි පංතියක් වශයෙන් ව්‍යාප්ත වීමට හේතු වි ය.

### බ්‍රිතාන්‍ය පාලන සමයේ ඉඩම් භුක්තිය

ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිපත්තිය පිළිබඳ වැදගත් තීන්දු තීරණ රාශියක් ගනු ලැබුයේ බ්‍රිතාන්‍ය පාලන සමයේ (1796-1948) දී ය. 1796 සිට 1815 දක්වා මුහුදු බඩ ප්‍රදේශ පාලනය කළ

ඉංග්‍රීසින් 1815 මාර්තු 2 වන දින මුළු දිවයින ම තමන්ගේ යටතට ගනු ලැබිණ. එ තැන් පටන් 1948 නිදහස ප්‍රදානය කරන තෙක් මේ රට පාලනය කරනු ලැබූයේ ඉංග්‍රීසි ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයකට අවශ්‍ය පදනම් වූ වතු වැවිලි අර්ථ ක්‍රමයක් ගොඩනැගීමේ පරමාර්ථ ඇති ව ය.

බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ඉඩම් භුක්තිය සම්බන්ධයෙන් ගනු ලැබූ මුල් ම හා වැදගත් ම ක්‍රියා මාර්ගය වූයේ 1832-1833 දී කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් රාජකාරි ක්‍රමය අහෝසි කිරීමයි. රාජකාරි ක්‍රමය අහෝසි කිරීම ලංකාවේ ඉඩම් භුක්තිය කෙරෙහි බල පෑ ආකාරය විග්‍රහ කරන තිස්ස ඊරියගම,

*රාජකාරි ක්‍රමය අහෝසි කිරීම නිසා ලංකාවේ ඉඩම් වැඩවසම් නීතිරීති වලින් නිදහස් විය. මිනිසුන් හා ඉඩම් අතර පැවති බැඳීම් ද ලිහිල් විණ. මේ නිසා භූමිය සහ ශ්‍රමය ඇතුළු නිශ්පාදන සාධක පිළිබඳ නිදහස් වෙළඳ පොළක් බිහි විය* (ඊරියගම,1997:69).

ඉඩමට සම්බන්ධ කොට තිබූ රාජකාරි ක්‍රමය අහෝසි කිරීම නිසා අවශ්‍ය නම් තමන් කැමති පරිදි ඉඩකඩම් විකිණීමටත්, කුල ක්‍රමයට පිටස්තර අලුත් රැකියා මාර්ගවලට පිවිසීමටත්, අවශ්‍ය නම් තමන් ජීවත් වන පාරම්පරික ප්‍රදේශ අතහැර වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීමටත් අවශ්‍ය නිදහස ගැමියන්ට ලැබුණි.

වැවිලි ආර්ථිකයක් ඇති කිරීමේ අදහසින් ක්‍රියාත්මක වූ බ්‍රිතාන්‍ය ඉඩම් ප්‍රතිපත්තිය තවදුරටත් විමසීමේ දී 1840 අංක 5 සහ අංක

වගුව 1. ධාන්‍ය බද්ද ගෙවීම පැහැර හැරීම නිසා රජය විසින් විකුණන ලද කුඹුරු ඉඩම් - 1882-1889 කාලය අතර

| දිස්ත්‍රික්කය | වී ගොවිතැන යටතේ පැවති කුඹුරු ඉඩම් කට්ටි සංඛ්‍යාව | ධාන්‍ය බද්ද නොගෙවීම නිසා විකුණන ලද කට්ටි සංඛ්‍යාව | විකුණන ලද කට්ටි සංඛ්‍යාව මුලු කට්ටි සංඛ්‍යාවේ % වශයෙන් | වී ගොවිතැන යටතේ පැවති කුඹුරු ඉඩම් අක්කර | විකුණන ලද කුඹුරු ඉඩම් අක්කර | විකුණන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය මුලු කුඹුරු ඉඩම් ප්‍රමාණයේ% වශයෙන් |
|---|---|---|---|---|---|---|
| කොළඹ | 45072 | 513 | 1.1 | 57484 | 633 | 1.1 |
| කළුතර | 28902 | 2476 | 8.5 | 45273 | 3555 | 7.4 |
| - මීගමුව | 17505 | 109 | 0.6 | 14932 | 89 | 0.5 |
| කෑගල්ල | 44201 | 491 | 1.1 | 21408 | 110 | 0.5 |
| රත්නපුරය | 25476 | 6359 | 24.9 | 26539 | 2443 | 9.2 |
| ගාල්ල | 31384 | 4832 | 15.3 | 45887 | 4036 | 8.7 |
| මාතර | 28622 | 1949 | 6.8 | 45997 | 1974 | 4.2 |
| හම්බන්තොට | 9715 | 337 | 3.4 | 20118 | 352 | 1.7 |
| මහනුවර | 35852 | 739 | 2.0 | 19130 | 344 | 1.7 |
| මාතලේ | 17723 | 317 | 1.7 | 9912 | 135 | 1.3 |
| නුවරඑළිය | 18847 | 2372 | 12.5 | | 474 | - |
| බදුල්ල | 29307 | 9433 | 32.1 | 17787 | 5408 | 30.4 |
| යාපනය | ? | 168 | - | | 108 | - |
| මඩකලපුව | 4797 | 1198 | 24.9 | 65773 | 18002 | 27.3 |
| ත්‍රිකුණාමලය | 1391 | 1 | 0.0 | 7814 | 16 | 0.2 |
| **එකතුව** | **338795** | **31295** | **100.0** | **398054** | **37751** | **100.0** |

*මූලාශ්‍රය (අබේවර්ධන 1999:99)*

වගුව 2. ඉඩම් විකිණීම 1833 - 1900

| කාල පරිච්ඡේදය | ඉඩම් කාණ්ඩ ගණන | අක්කර ප්‍රමාණය | ආදායම රු. |
|---|---|---|---|
| 1833-45 | 3093 | 294526 | 1925080 |
| 1846-50 | 688 | 14607 | 282390 |
| 1851-55 | 340 | 20482 | 338350 |
| 1856-60 | 7243 | 104310 | 1834740 |
| 1861-65 | 19373 | 156893 | 3071170 |
| 1866-70 | 34064 | 186073 | 2709620 |
| 1871-75 | 26094 | 238542 | 4169181 |
| 1876-80 | 21707 | 161553 | 5368922 |
| 1881-85 | 25286 | 118391 | 1916122 |
| 1886-90 | 17319 | 85030 | 1643011 |
| 1891-95 | 15426 | 76613 | 2082037 |
| 1896-1900 | 25687 | 117876 | 3161835 |
| 1901-1905 | 46976 | 164350 | 4214594 |
| 1906 | 8456 | 58958 | 2619984 |
| එකතුව | 251732 | 1798212 | 35337076 |

*මූලාශ්‍රය (අයිවන් 1999:96)*

වගුව 3. 1936-1938 දී ඉඩම් අයිතිය

| ඉඩම් කොටස | ප්‍රතිශතය% |
|---|---|
| ඉඩම් නැති | 44 |
| අක්කර 1 අඩු | 21 |
| අක්කර 1-5 | 26 |
| අක්කර 5 හා ඊට වැඩි | 9 |

*මූලාශ්‍රය (ඊරියගම 1997:71)*

12 දරන කිරීට ඉඩම් ආඥා පනත (Crown Land Ordinances of 1840) එහි වැදගත් අවස්ථාවක් ලෙස සැලකිය හැකි වේ. මෙ මගින් එ තෙක් පුද්ගලයන් භුක්ති විඳි ඉඩම්වල අයිතිය ඔප්පු කළ යුතු ය. එ සේ නොවන ඉඩම් කිරීට ඉඩම් වශයෙන් සැලකූ අතර ඒවායේ පදිංචි කරුවන් නීති විරෝධී පදිංචි කරුවන් ලෙස සලකන ලදී. මේ නිසා ඉඩම් අයිතිය ඔප්පු කර ගත නොහැකි වූ ඉඩම් විශාල වශයෙන් යටත් විජිත රජයේ ඉඩම් බවට වි ය. මේ නිසා ගැමියන් බොහෝ කලක් පාරම්පරික වශයෙන් භුක්ති විඳි ඉඩම් ගැමියන්ගෙන් ගිලිහී යන්නට වි ය.

බ්‍රිතාන්‍ය ඉඩම් ප්‍රතිපත්තියේ තවත් වැදගත් අවස්ථාවක් ලෙස 1856 අංක 10 දරන විහාර දේවාල ගම් ආඥා පනත (Temple Land Ordinance of 1856) පෙන්වා දිය හැකි ය. මෙම පනත අනුව විහාරස්ථාන සතු ව පවතින ඉඩම් පිළිබඳ ව ලේඛනයක් සකස් කිරීමට කටයුතු සම්පාදනය කරන ලදී. ඒ සඳහා යන වියදම් පන්සල් විසින් දැරිය යුතු වි ය. නමුත් මේ සඳහා වියදම් දැරීමට පන්සල්වලට නොහැකි වූ නිසා ශතවර්ෂ ගණනාවක් ම විහාර සතුව පැවති ඉඩම් බ්‍රිතාන්‍ය ආණ්ඩුවට අයත් වි ය.

1872 ධාන්‍ය බදු ආඥා පනත (Grain Tax Ordinance of 1872) බ්‍රිතාන්‍ය ඉඩම් ප්‍රතිපත්තියේ තවත් වැදගත් අවස්ථාවකි. මේ

අනුව, ඉඩම්වල ආදායමින් රජයට බද්දක් ගෙවීමට නියම වූ අතර ගැමියන්ට ඒ සඳහා වත්කම් නොමැති වූ හෙයින් තවත් ඉඩම් ප්‍රමාණයක් බ්‍රිතාන්‍යයන්ට සතු කර ගැනීමට හැකි වි ය. මෙම ධාන්‍ය බදු අයකරගත් ආකාරය විග්‍රහ කරන අයිවන්,

> *අය කරනු ලබන ධාන්‍ය බද්දට සියලු කුඹුරු ඉඩම් අයත් වූ අතර අය කරන ලද බද්දේ ප්‍රමාණය කලින් කලට ද ප්‍රදේශ හෝ පුද්ගලයින් අනුව ද වෙනස් විය. 1818 කැරැල්ලෙන් පසුව ඇති කරන ලද නියමයක් අනුව කුඹුරු හිමියන් රජයට ගෙවිය යුතු ධාන්‍ය බද්ද අස්වැන්නෙන් 1/10 ක් වු අතර කැරැල්ලේ දී රජයට පක්ෂපාතීව ක්‍රියාකළ ප්‍රදේශ සඳහා එය අස්වැන්නෙන් 1/14 ක් ද, රාජ්‍ය විරෝධී ප්‍රදේශ සඳහා අස්වැන්නෙන් 1/5 ක් තරම් ද විශාල විය* (1999:97).

රජය මෙම ධාන්‍ය බදු අයකර ගැනීමට අනුගමනය කළ ප්‍රතිපත්ති ද ඉතා දරදඬු ස්වරූපයක් ගනු ලැබිණ. විශේෂයෙන් 1866 අංක 5 දරන ආඥා පනත අනුව ධාන්‍ය බදු ගෙවීම පැහැර හරින ගොවීන්ගේ කුඹුරු ඉඩම් වෙන්දේසි කොට රජයට අයවිය යුතු ධාන්‍ය බදු අයකර ගැනීමේ බලය බදු එකතු කරන්නන්ට පවරනු ලැබී ය. මෙම නීතිය මගින් ගම්බද ගොවි ජනතාව කෙරෙහි කරන ලද බලපෑම ඉතා විශාල ය.

ඉහත වගුව අනුව විකිණී ඇති මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය ලංකාවේ වගා කරන මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් 9.4%කි. බදුල්ල දිස්ත්‍රික්කයෙන් වගා කරන මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් 30.4%ක් ද මඩකලපුව දිස්ත්‍රික්කයෙන් 27%ක් ද ගාල්ල, රත්නපුර හා කළුතර දිස්ත්‍රික්කවල පිළිවෙළින් 8.7%ක්, 9.2%ක් හා 7.4%ක් ද වී තිබේ. මේ ආකාරයට ධාන්‍ය බදු ගෙවීම පැහැර හැරීම යටතේ ගම්බද ජනයාගේ ඉඩම් විශාල වශයෙන් බ්‍රිතාන්‍යයන් විසින් අත්පත් කර ගෙන තිබේ.

දහනව වන ශත වර්ෂයේ බ්‍රිතාන්‍ය ඉඩම් ප්‍රතිපත්තියේ ඉතා වැදගත් අවස්ථාවක් ලෙස 1897 අංක 1 දරන මුඩුබිම් ආඥා පනත (Waste Land Ordinance of 1892) හැඳින් විය හැකි ය. වගා නොකරන ඉඩම් රජයට අයත් ඉඩම් වශයෙන් සලකා ගැමියන් සතු ඉතිරි පාරම්පරික ඉඩම් ද බ්‍රිතාන්‍යයන් විසින් පවරා ගනු ලැබිණ. මේ ආකාරයට 19 වන ශත වර්ෂයේ විවිධ අණ පනත් මගින් මේ රටේ ගැමියන් සතු ඉඩම් බොහෝමයක් බ්‍රිතාන්‍යයන් විසින් අත් පත් කරගෙන තිබේ. මෙ සේ අත්පත් කර ගනු ලැබූ ඉඩම් වතු වගාව සඳහා උනන්දුවක් දක්වන යුරෝපීය සහ ස්වදේශීය ආයෝජකයින්ට අක්කරය සිලිං 5 සිට සිලිං 20 දක්වා වන මුදලකට විකුණනු ලැබිණ (අයිවන් 1999:53).

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන වලට අනුව 1830 සිට 1860 දක්වා කාලය තුළ පමණක් යුරෝපීය ආයෝජකයින් විසින් එසේ ආණ්ඩුව විසින් විකුණනු ලැබූ ඉඩම්වලින් මිල දී ගෙන තිබුණු ඉඩම් ප්‍රමාණය අක්කර 44,000කි. පැට්රික් පීබල්ස්ගේ සංඛ්‍යා ලේඛනවලට අනුව 1860 සිට 1889 දක්වා කාලය තුළ තවදුරටත් යුරෝපීයන් විසින් මිල දී ගෙන තිබුණු ඉඩම් ප්‍රමාණය අක්කර 165,000ක් පමණ වන අතර එම කාලය තුළ ස්වදේශිකයන් මිල දී ගෙන තිබුණු ප්‍රමාණය අක්කර 83,700ක් වි ය (අයිවන් 1999:53).

මේ ආකාරයට ගැමියන් සතු ඉඩම් කොල්ලකෑම හේතුකොටගෙන ගැමියා ස්වකීය ගමේ ඉඩකඩම් අහිමි තත්ත්වයකට පත් වූ බව 1936-38 කාලය තුළ දිස්ත්‍රික්ක 8 ක් ආශ්‍රයෙන් කරන ලද සමීක්ෂණයට අනුව දාස් ගුප්තා විසින් පෙන්වා දී ඇත. ඔහුගේ සමීක්ෂණයට අනුව ලංකාවේ ගම්බද ඉඩම් භුක්තියේ ස්වරූපය පහත සඳහන් පරිදි වේ.

බ්‍රිතාන්‍ය ඉඩම් ප්‍රතිපත්තිය නිසා ප්‍රධානතම නිෂ්පාදන සාධකය අහිමි වූ ලාංකික ගැමි ජනතාව අසරණ තත්ත්වයට පත් වි ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රාමීය ආර්ථිකය තුළ දැඩි ප්‍රශ්න හා අහිතකර බලපෑම් එල්ල වන්නට වූ අතර 20 වන සියවස ආරම්භ වන විට මේ සම්බන්ධ ව විවිධ උද්ඝෝෂණ ඇති වි ය. මේ තත්ත්වයට විසඳුම් සොයා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස 1927 ඉඩම් කොමිසමක් පත් කරන ලදී. මෙම කොමිසමේ නිර්දේශ මත පනත් දෙකක් සැකසුණි. පළමු වැන්න ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනතයි. මෙ මගින් ඉංග්‍රීසින්ගේ අණපනත් නිසා ඉඩම් අහිමි වූ පුද්ගලයින්ට තම අයිතිය ඉදිරිපත්

කොට සහනයක් ලබා ගත හැකි වි ය. දෙවැන්න, 1935 ඉඩම් සංවර්ධන ආඥා පනත යි (Land Development Ordinance of 1935). මේ මගින් රජයට අයත් ඉඩම් බදු පදනමක් මත නැවත ගොවියන්ට ලබා ගත හැකි වි ය.

බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ඉඩම් භුක්තිය පිළිබඳ විමසීමේ දී 1889 දී කැලෑ දෙපාර්තමේන්තුව පිහිටුවීම, 1900 දී වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම, 1900 දී මිනින්දෝරු දෙපාර්තමේන්තුව පිහිටුවීම, විශේෂ අවස්ථාවන් ලෙස සැලකිය හැකි ය.

කවර ජාතියකට වුව ද අයිති උසස් ම ධනය ඉඩම් බවත් ජනතාවගේ යහපත උදෙසා ඉඩම් පරිහරණය කළ යුතු බවත් 1933 රාජ්‍ය මන්ත්‍රණ සභා පිහිටුවීමේ දී එස්.ඩබ්. ආර්.ඩී. බණ්ඩාරනායක පවසා ඇත (සිළුමිණ 2004.10.10). මෙ වැනි ප්‍රකාශ යටත් විජිත සමයේ ඉඩම් අහිමි කොටස්වලට ඉඩම් ලබා දීමට මූලික වී තිබේ.

මේ ආකාරයට ඉංග්‍රීසින් විසින් ඇති කරන ලද ධනේශ්වර අර්ථ ක්‍රමයට යෝග්‍ය වතු වගාවක් ඇති කිරීම සඳහා සිංහල ගැමි ජනතාව තමන් භුක්ති විඳි ඉඩම්වලින් පලවා හරිනු ලැබූ බව පැහැදිලි කරුණකි. මෙ සේ විවිධ අණපනත් මගින් අත්පත් කර ගත් ඉඩම් පළමු ව කෝපි වතු වශයෙන් ද පසුව තේ හා රබර් වතු බවටත් පත් කර ගනු ලැබුණි. මෙ වැනි පසුබිමක ඉඩම් නැතිකම සහ ප්‍රමාණවත් ඉඩම් නැතිකම හේතුකොටගෙන ග්‍රාමීය ජනකොටස් මහත් අගහිගකම් මත කල් ගෙවන පිරිසක් බවට පත් වි ය.

## නිගමනය

ඉඩම් භුක්තිය සහ සිංහළ ගැමි අර්ථ ක්‍රමය පිළිබඳ විග්‍රහ කිරීමේ දී ග්‍රාමීය ආර්ථිකය තුළ ඉඩම් භුක්තියේ ස්වරූපය විවිධ විපර්යාසයන් ඔස්සේ විකශනය වෙමින් ක්‍රියාත්මක වූ බව පැහැදිලි වේ. අධිරාජ්‍යවාදීන් මෙ රටට පැමිණීමට පෙර පැවති රාජාණ්ඩු පාලන සමය තුළ රජුගේ පූර්ණ බලපෑම මත ඉඩම් භුක්තිය තීරණය වූ අතර අනිවාර්ය රාජකාරී සේවාව සමග ඉඩම් භුක්තිය ඇඩි ව බැඳී පැවතුණි. නමුත් අධිරාජ්‍යවාදීන් මෙ රටට පැමිනීමත් සමග ම ඉඩම් භුක්තියේ පැවති ස්වරූපය ක්‍රමයෙන් වෙනස් වන්නට වි ය. රාජකාරී සේවාව සහ ඉඩම් භුක්තිය අතර තිබූ සම්බන්ධය අහෝසි වූ අතර ඉඩම්වලට පුද්ගලික අයිතියක් ආරෝපණය වන්නට වි ය. මේ තත්ත්වය වර්ධනය වීම නිසා නූතනයේ ඉඩම් වෙළඳපොළේ අලෙවිවන භාණ්ඩයක් බවට පත්ව තිබේ. එ සේ ම ඉඩම් භුක්තිය සම්බන්ධ නිතිරීති වර්ධනය වීම තුළ ඉඩම් අයිතිය වඩාත් ක්‍රමානුකූල ව ලබා ගැනීමට හැකියාව ලැබී තිබේ. පුද්ගලයකුගේ තරාතිරම පෙන්වන සාධකයක් ලෙස ඉඩම්වලට වැඩිවටිනාකමක් හිමිවීම නිසා ග්‍රාමීය නාගරික බේදයකින් තොර ව අදටත් පුද්ගලයෝ තමන්ගේ ඉඩම් අහිමිවනවාට දක්වන්නේ ඇඩි අකමැත්තකි. ගැමි අර්ථක්‍රමයට නූතන වෙළඳපොල බලවේග අන්තර්ගත වීම නිසා යම්තාක් දුරකට මෙම තත්වය වෙනස් වී ඇතත් ගැමියෝ කෘෂිකාර්මික කටයුතුවල අදටත් නිරත වී සිටිති. මේ නිසා ගැමි අර්ථ ක්‍රමය තුළ ඉඩම් සම්බන්ධව තිබූ වටිනාකම අඩු වී නොමැති බව කිව යුතු ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අමුණුගම, සරත්, (1999), *සංස්කෘතිය සමාජය සහ පරිසරය*, බොරැල්ල, සදීපා පොත් හල.

අභයසිංහ, ටිකිරිබංඩා හේරත්, (1996), *පරංගි කෝට්ටේ*, කොළඹ.

අමරසේකර, දයා, (1988), *ශ්‍රී ලංකා සමාජය*, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ.

අයිවන්, වික්ටර්, (1990) *ශ්‍රී ලංකාවේ නූතන කැරලිකරුවන්ගේ සමාජ පසුබිම*, සර්වෝදය ග්‍රන්ථ ප්‍රකාශකයෝ, රත්මලාන.

ආරියපාල, ඇම්.බී., (1962), *මධ්‍යකාලීන ලංකා සමාජය*, රාජ්‍ය භාෂා දෙපාර්තුමේන්තුව, කොළඹ.

ඊරියගම, තිස්ස, (1998), *කාර්මික විප්ලවය*, ජාතික අධ්‍යාපන පදනම, කොළඹ.